ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

අධ්‍යාපන පීඨය

අධ්‍යාපනවේදී (නාට්‍ය හා රංගකලා)උපාධි වැඩසටහන-පස්වන මට්ටම 2017/18

අවසාන පරීක්ෂණය - 2018

ළමා අයිතිවාසිකම් - ESU3130

කාලය පැය තුනයි. (03)

---

දිනය:- 2018.02.05 වේලාව - ප.ව.01.30 - ප.ව.04.30 දක්වා

---

**1 වන කොටසේ සියළුම ප්‍රශ්නවලට ද, 2 වන කොටසේ ඕනෑම ප්‍රශ්න තුනකට (03) ද පිළිතුරු සපයන්න.**

## 1 වන කොටස

01. ශ්‍රී ලංකාවේ ළමයින්ගේ තත්ත්වය සුරක්ෂිත කිරීම සඳහා ලන්දේසි යුගයේ දී ගන්නා ලද පියවර කෙටියෙන් පැහැදිලි කරන්න.

02. වර්තමාන පාසල තුළදී වෙන්කොට නොසැලකීමේ මූලධර්මය ගුරුවරුන් වෙතින් උල්ලංඝනය වන අවස්ථා **පහක් (05)** ලියන්න.

03. ශ්‍රී ලංකාවේ ළමයින්ට යහපත් ළමා සුභසාධන ප්‍රතිපත්තියක් උදෙසා 1939 දී ගන්නා ලද ක්‍රියාමාර්ග **දෙකක් (02)** කෙටියෙන් දක්වන්න.

04. විශේෂ අවශ්‍යතාවන්හි පසුවන ළමයින් කවුරුන්දැයි නිර්වචනය කර එවැනි ළමයින් සඳහා උදාහරණ **දෙකක් (02)** ලියන්න.

05. “දරුකමට හදා ගැනීම” යනුවෙන් ඔබ අදහස් කරන්නේ කුමක් ද?

06. ශ්‍රී ලංකාවේ ළමා අපයෝජනය කෙරෙහි බලපාන ප්‍රධාන සාධක **පහක් (05)** නම් කරන්න.

07. ළමයින්ගේ අයිතිවාසිකම් සුරක්ෂණය සඳහා ජනමාධ්‍ය කරුවාට කළ හැකි කාර්යයන් **පහක් (05)** සඳහන් කරන්න.

08. ශ්‍රී ලාංකික ළමයින්ගේ අයිතිවාසිකම් සුරැකීම සඳහා ජාතික ළමා ආරක්ෂණ අධිකාරය ඉටුකරන කාර්යයන් **තුනක් (03)** ලියන්න. (ලකුණු 5 x 8 = 40)

## 2 වන කොටස

09. (i) ළමා අයිතිවාසිකම් යනුවෙන් ඔබ අදහස් කරන්නේ කුමක් ද? (ලකුණු 03)

(ii) ශ්‍රී ලංකාවේ යටත්විජිත යුගයට පෙර සමයේ ළමා අයිතීන් සම්බන්ධව පැවැති තත්ත්වය විස්තර කරන්න. (ලකුණු 07)

(iii) ඔබ ඉහත (ii) හි සඳහන් කළ තත්ත්වය, වර්තමානයේ ශ්‍රී ලාංකික ළමයින්ගේ ළමා අයිතීන්වල පවතින තත්ත්වය සමග සංසන්දනය කරන්න. (ලකුණු 10)

10. (i) ජීවත්වීමේ අයිතිය යනු කුමක් ද? (ලකුණු 02)

(ii) ශ්‍රී ලංකාවේ ළමුන්ගේ ජීවත්වීමේ අයිතිය තහවුරු කිරීම සඳහා රජයයන් ගෙන ඇති පියවර **පහක් (05)** කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 08)

(iii) ඔබ ඉහත (ii)සඳහන් කළ පියවර තුළ දක්නට ලැබූ අඩුපාඩු පෙන්වා දෙමින් එම අඩුපාඩු අවම කර ගැනීමට සුදුසු යෝජනා ඉදිරිපත් කරන්න. (ලකුණු 10)

11. (i) ලෝකයේ ජීවත්වන විශේෂ තත්ත්වයේ පසුවන ළමයින් සඳහා එක්සත් ජාතීන්ගේ ළමා අයිතිවාසිකම් සම්මුතිය මගින් සපයා ඇති සේවාවන් මොනවා ද? (ලකුණු 04)

(ii) ශ්‍රී ලංකාවේ විශේෂ තත්ත්වයේ පසුවන ළමුන්ගේ යහපැවැත්ම සඳහා රජයක් ලෙස ගත හැකි ක්‍රියාමාර්ග **තුනක් (03)** කෙටියෙන් පෙන්වා දෙන්න. (ලකුණු 06)

(iii) ඔබ ඉහත සඳහන් කළ ක්‍රියාමාර්ගවල දක්නට ලැබෙන අඩුපාඩු **තුනක් (03)** සඳහන් කර එම අඩුපාඩු අවම කර ගැනීම සඳහා රජයට යෝජනා ඉදිරිපත් කරන්න. (ලකුණු 10)

12. "සිසුන් තුළ සහභාගිත්ව අයිතිය තහවුරු කිරීමෙහි ලා පාසල් ගුරුවරයා සතු කාර්යභාරය අවතක්සේරු කළ නොහැක."

(i) සහභාගිත්ව අයිතිය යනුවෙන් ඔබ අදහස් කරන්නේ කුමක් ද? (ලකුණු 03)

(ii) සිසුන් තුළ සහභාගිත්ව අයිතිය තහවුරු කිරීමට නාට්‍ය හා රංග කලා ගුරුවරයෙකු සතු කාර්යභාරය කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 07)

(iii) සහභාගිත්ව අයිතිය සහතික වීම නිසා, පාසල් සිසුන් තුළින් විද්‍යාමාන වන සුවිශේෂී ලක්ෂණ මොනවා ද? (ලකුණු 10)

13. (i) එක්සත් ජාතීන්ගේ ළමා අයිතිවාසිකම් පිළිබඳ කමිටුවේ සංයුතිය කෙසේ ද? (ලකුණු 02)

(ii) එම ළමා අයිතිවාසිකම් කමිටුව සතු කාර්යයන් හතරක් **(04)** සඳහන් කරන්න. (ලකුණු 08)

(iii) ශ්‍රී ලංකාවේ ළමා අයිතිවාසිකම් ප්‍රවර්ධනය සඳහා කළ හැකි යෝජනා, (අවම වශයෙන් 5 ක්) කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 10)

14. (i) ශ්‍රී ලංකාවේ ළමා අයිතිවාසිකම් පිළිබඳ අත්‍යාවශ්‍ය තොරතුරු ඇතුළත් ප්‍රධාන ලිපි ලේඛන තුනක් **(03)** නම් කරන්න. (ලකුණු 03)

(ii) ඔබ ඉහත නම් කරන ලද එක් ලිපි ලේඛනයක් පිළිබඳව කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 07)

(iii) ළමා අයිතිවාසිකම් පිළිබඳ සන්නිවේදන හා සම්බන්ධයෙන් පාසල් ගුරුවරුන් සතු වගකීම සාකච්ඡා කරන්න. (ලකුණු 10)

හිමිකම් ඇවිරිණි.